# සාන්ත පිලිප් සහ ජාකොබ් අපෝස්තුළුවරු
## මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය 1 කොරින්ති 15: 1-8

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"උන්වහන්සේ ජාකොබ්ට ද ඉන්පසු අපෝස්තුළුවරුන්ට ද දර්ශනය වූ සේක."

නවද, සහෝදරවරුනි, මා ඔබට දේශනා කළ සුබ අස්න වෙත ඔබගේ අවධානය දැන් යොමු කරනු කැමැත්තෙමි. ඔබ එය පිළිගත්තහු ය. එහි පිහිටා සිටින්නහු ය. ඒ මගින් ඔබ ගැළවීම ලබන්නහු ය. එසේ වන්නේ මා ඔබට දෙසූ ලෙසම, ඒ සුබ අස්න නිසැක ව පිළිගෙන, එය නිෂ්ඵල නොවන ලෙස විශ්වාස කළොත් පමණකි.
මා ඔබට බාර දුන්නේ මා ලබාගත් දෙය ම බව ප්‍රධාන කොට කිව යුතු ය. එනම් ශුද්ධ ලියවිල්ල ප්‍රකාර ක්‍රිස්තුන් වහන්සේ අපගේ පාප උදෙසා මළ බවත්, වළලනු ලැබූ බවත්, ශුද්ධ ලියවිලි ප්‍රකාර තුන් වන දා උත්ථාන කරනු ලැබූ බවත්, කේපස්ට හා පසුව දොළොස් දෙනාට දර්ශනය වූ බවත් ය. ඉන්පසු උන්වහන්සේ පන් සියයකට වැඩි සහෝදර සමූහයකට එක විට ම දර්ශනය වූ සේක. මොවුන්ගෙන් සමහරුන් මිය ගිය ද, වැඩි දෙනා තවමත් ජීවත් ව සිටිති. ඉන්පසු උන් වහන්සේ ජාකොබ්ට ද අනතුරුව සියලු ප්‍රේරිතයන්ට ද දර්ශනය වූ සේක. අවසන් වශයෙන් අකලට උපන්නෙකු වැනි මට ද උන්වහන්සේ දර්ශනය වූ සේක.

*ම දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 19:1–4

පිළිතුර: ඒ පණිවුඩය ලෝ පුරා පැතිරී යන්නේය.

ගීය : අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ ය.
ගුවන් තලය එතුමන්ගේ අත්කම් විදහා පාන්නේ ය.

එක් දිනක් තව දිනකට මෙපුවත කියන්නේ ය:
එක් රැයක් තව රැයකට එය ම පවසන්නේ ය.

කතාවක්, වදනක්, කිසියම් හඬක් ඇසෙන්නේ නැති වුව ද
ඒ පණිවුඩය ලොව පුරා පැතිරී යන්නේ ය.
එය දියත දසත විහිදී යයි,
දෙවි තුමාණෝ හිරුට එහි මණ්ඩපයක් සාදා දුන් සේක.

## සුපුවත් ජය නද ජොහන් 14: 6,9

ආලේලූයා ආලේලූයා
'මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි:
පිලිප්, මා දුටු තැනැත්තේ, පියාණන් වහන්සේ දුටුවේ ය.''යි
ස්වාමීන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා

## සුවිශේෂය ජොහන් 14: 6–14

*සුවිශේෂක ජුවාම් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"මෙපමණ කලක් ඔබ සමඟ සිටි නමුත් ඔබ මා නොහඳුනන්නෙහි ය."

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි: මා මඟින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය. ඔබ මා හඳුනන්නහු නම්, මාගේ පියාණන් වහන්සේත් හඳුනන්නහු ය. මෙතැන් පටන් ඔබ උන්වහන්සේ හඳුනන්නහු ය: උන්වහන්සේ දැක ඇතැ"යි වදාළ සේක.

පිලිප් කතා කොට, "ස්වාමිනි, පියාණන් වහන්සේ අපට පෙන්වා වදාළ මැනව: එය අපට හොඳට ම ඇතැ" යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "පිලිප්, මෙපමණ කලක් මා ඔබ සමඟ විසූ නමුදු, තවමත් ඔබ මා හඳුනන්නේ නැද් ද? මා දුටු තැනැත්තේ, පියාණන් වහන්සේ දුටුවේ ය. එසේ නම්, 'පියාණන් වහන්සේ අපට පෙන්වා වදාළ මැනැවැ'යි ඔබ කියන්නේ කෙසේ ද? මා පියාණන් වහන්සේ තුළ ද පියාණන් වහන්සේ මා තුළ ද සිටින බව ඔබ විශ්වාස නොකරන්නෙහි ද? මා ඔබ හට වදාරන වචන මාගේ ම අධිකාරී බලයෙන් නොවදාරමි: පියාණන් වහන්සේ ම මා තුළ වැඩවසමින් ස්වකීය ක්‍රියා ඉටු කරන සේක. මා පියාණන් වහන්සේ තුළ ද පියාණන් වහන්සේ මා තුළ ද සිටින බවට මාගේ වචනය විශ්වාස කරන්න: එසේ නැත්නම් මාගේ ක්‍රියා නිසා වත් මා විශ්වාස කරන්න.

ඒකාන්තයෙන් ම මම එසේ, ඔබට කියමි, මා අදහන්නා මා කරන ක්‍රියා ද කරන්නේ ය. තවද මා පියාණන් වහන්සේ වෙතට වඩින බැවින් ඔහු මීටත් වඩා මහත් ක්‍රියා කරන්නේ ය. පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමයට පමුණුවනු ලබන පිණිස, ඔබ මාගේ නාමයෙන් අයදින කවර දෙයක් වුව ද මම ඉටු කරන්නෙමි. ඔබ මාගේ නාමයෙන් අයැදින කවර දෙයක් වුව ද මම ඉටු කරන්නෙමි."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*